**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2023**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ("මණ්ඩලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 08 (LKAS 08) හි 42 වැනි ඡේදයට පටහැනිව, දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීමට අදාළ ඉකුත් වර්ෂයේ දෝෂ එකතුව වූ රු. 2,949,214ක් සමාලෝචිත වර්ෂයේ දී ගළපා තිබුණි. | ඉකුත් වර්ෂයට අදාළව 2023 වර්ෂයේ දී ගළපන ලද මුදල රු. 2,949,214ක් වූ අතර එය 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්තා කළ ආදායමෙන් 0.41%ක් පමණක් විය. අතිරේක වශයෙන්, එය වාර්තා කරන ලද මුළු විස්තීර්ණ ආදායමෙන් 3.8%ක් පමණක් විය. එබැවින්, ප්‍රමාණාත්මකභාවය පදනම්ව, එකී ගනුදෙනුව ඉකුත් වර්ෂයේ ගනුදෙනුවක් වශයෙන් සලකා බැලීම අවශ්‍ය නොවනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ශේෂය නැවත ප්‍රකාශ කිරීමෙන් ඉකුත් කාල සීමාවේ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ව්‍යාපෘතියක් සඳහා ආපසු නොගෙවනු ලබන රජයේ කොටස් ලෙස 1994 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ගෙවන ලද රු.49,250,000ක් කොටස්වල සිදු කරන ලද ආයෝජනයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අපනයන සංවර්ධන මණ්ඩලයට මෙම මුදල් නැවත ඉල්ලුම් කළ නොහැකි අතර 1994 ජනවාරි 25 දිනැති කැබිනට් අනුකම්පූ තීරණය අනුව වරණීය කොටස් ආයෝජන ලෙස වාර්තා කර තිබූ රජයේ දායකයක් වූ රු.මි.4,925ක මුදල පොත්වලින් ලියා හැරීම සඳහා | ආයෝජන නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

| | | |
|---|---|---|
| | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අවසර ඉල්ලා ඇත. | |
| (ආ) මණ්ඩලය විසින් පෞද්ගලික සමාගමක ආයෝජනය කළ රු. 13,150,000 ක් වූ කොටස් 1,413,772 ක 2023 දෙසැම්බර් 31 දිනට වෙළෙඳපොල වටිනාකම ලෙස, 2022 දෙසැම්බර් 31 දිනට වෙළෙඳපොල වටිනාකම වූ රු.158,639,356 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වුවද, කොටස්වල වෙළඳපල වටිනාකම ගණනය කිරීමේ පදනමේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු කර නොමැති බැවින් 2023 දෙසැම්බර් 31 දිනට කොටස්වල වෙළඳපල වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳපල වටිනාකමට සමාන බව විගණනයට තහවුරු නොවීය. | ආයෝජන සමාගම සහ සමාන සමාගම යන දෙකම 2023 වසර සඳහා පාඩු වාර්තා කළ බැවින් 2023/12/31 දිනට ආයෝජන සමාගමේ කොටස්වල වෙළෙඳපොළ වටිනාකම තීරණය කළ නොහැකි විය. ආයෝජන සමාගමේ කොටස්වල වටිනාකම හානිකරණය සඳහා පරීක්ෂා කර ඇති අතර, වාර්තා කිරීමේ අරමුණු සඳහා යොදාගන්නා ලද අගය හානිකරණය වීම පිළිබඳව යෝජනා කිරීමට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින්, 2023/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා එම අගයම වාර්තා කරන ලදී. | පිළිගත හැකි ක්‍රමයක් භාවිතා කරමින් කොටස්වල වෙළඳපල වටිනාකම ගණනය කළ යුතුය. |

### 1.5.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| අධිකාරි බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තර | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටි අනුමැතිය ලබා දී නොතිබුණද, සියයට 4.2 ක පොළී අනුපාතයක් සහිත ණය කාණ්ඩ හතරකින් සමන්විත කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය 1985 වැනි වසරේ සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක වන අතර 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය ශේෂය රු.41,554,053 ක් විය. | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව 1985 වසරේ සිට කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 08/2005 සහ 26/97 යන චක්‍රලේඛ මත පදනම්ව මෙම ණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. මණ්ඩලය විසින් ණය යෝජනා ක්‍රම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2007.05.29 දින අපනයන සංවර්ධන හා අන්තර්ජාතික වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාව ලබා ගන්නා ලදී. | සහන පොළී අනුපාත සහිත කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) ස්ථිර තනතුරක වසර 25ක් සම්පූර්ණ කර ඇති සේවකයන් විශ්‍රාම යාමේදී හෝ සේවයෙන් ඉවත් වන විට ඔවුන් වෙත මණ්ඩලය විසින් රාජ්‍ය ව්‍යාපාර | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මණ්ඩලයේ වසර 25 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම යාමේ දී හෝ | වසර 25 සම්පූර්ණ කළ කාර්ය මණ්ඩලයට ත්‍යාග පිරිනැමීමේ යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පවුම් භාගයක රන් කාසි තෑගි කර තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.595,600 ක් වැය කර තිබුණි. | ඉල්ලා අස්වීමේ දී ඔවුන්ගේ සේවය අගය කරමින් පවුම් භාගයක රන් කාසියක් තෑගි කරයි. මණ්ඩලයේ සුභසාධක සංගමය මගින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව, සභාපති/ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය ඇතිව, 2014 වසරේ මෙම ක්‍රියාමාර්ගය ආරම්භ කරන ලදී. 2023 විශ්‍රාම ගන්නා ලද මේ සඳහා සුදුසුකම් ලත් සේවකයින් 7 දෙනෙකු සඳහා රන් කාසි පිරිනැමීම වෙනුවෙන් රු. 595,600/- ක් වැය කර ඇත. මේ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබාගෙන නොමැත. | ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල රු. | ලබා නොදුන් සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) කොටස්වල ආයෝජන | 35,431,905 | කොටස් සහතික | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම සමාගම්වල ආයෝජනය කර ඇත්තේ ඔවුන්ගේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට සහ බැංකුවලින් ණය පහසුකම් ලබා ගැනීමට පහසුකම් සැලසීමටය. කෙසේ වුවද, ඇවර කරන්නාට සමාගම්වල මුල් කොටස් සහතිකය ලබා දීම සහ කොටස් සහතික විමර්ශනය කිරීමට භාජනය කර තිබීම යනාදී හේතුන් මත එම සමාගම්වල කොටස් සහතික මණ්ඩලය සතුව නොමැත. | අදාළ ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ)කොටස් ආයෝජන වල හානිකරණය | 35,273,710 | කොටස් සහතික | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් අපනයනකරුවන් වෙත ලබා දුන් අපනයන ණයවලින් අපනයනකරුවන් 146 දෙනෙකුගෙන් ලැබිය යුතු මුදල රු. 38,027,520 ක් විය. එම මුදලින් සියයට 96ක් වසර 25කට අධික කාලයක සිට අයකරගෙන නොතිබුණි. | මෙම ඉතිරි අපනයනකරුවන්ගෙන් බහුතරයක් විවිධ අනපේක්ෂිත අභියෝගවලට මුහුණ පා ඇති අතර මෑත කාලයේ අප රට මුහුණ දුන් අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් අපේක්ෂා කළ පරිදි ඔවුන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. එවැනි තත්ත්වයන් යටතේ, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ණය අය කර ගැනීමේ ක්‍රියාකාරකම් ඵලදායි ලෙස සිදු කිරීමට අපනයන සංවර්ධන මණ්ඩලයට නොහැකි විය. | අපනයන ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) ආයතන 07කින් සේවා ලබා ගැනීම සඳහා ලබා දුන් රු.901,000ක තැන්පතු මුදල් වර්ෂ 07 ත් 25ත් අතර කාලයක සිට මණ්ඩලය විසින් ආපසු අයකර ගෙන නොතිබුණි. | ආපසු ගෙවිය යුතු තැන්පතු බොහෝමයක් විශේෂ පැවරුමක් හරහා 2022 වර්ෂයේ දී එකතු කර ඇත. කෙසේ වුවද, විවිධ හේතුන් මත ආපසු අයකර ගැනීමට නොහැකි වූ එම තැන්පතු වෙනුවෙන් වර්තමානයේ හානිකරණ සඳහා ප්‍රතිපාදන ලෙස රු. 884,949 ක් පවත්වාගෙන යයි. | සේවා ලබා ගැනීම සඳහා තැන්පත් කර ඇති මුදල් ආපසු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන (UPEPV) වැඩසටහන යටතේ ගොවීන් වෙත ලබා දුන් රු. 10,403,683 ක මුදලක් වසර 14කට අධික කාලයක් සිට අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ඌව පරණගම අපනයන ගම්මාන සමාගම විසින් වගාකරුවන්ගෙන් නිෂ්පාදන එකතු කර ව්‍යාපෘතියට සම්බන්ධ අපනයනකරුවන් වෙත ලබා දෙන ලදී. EDB විසින් අපනයන සමාගම්වල විකුණුම් ආදායම එකතු කර භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය වාරික ප්‍රේෂණය කිරීම, නිෂ්පාදන ලබා දුන් වගාකරුවන් වෙත ගෙවීම, සහ පරිපාලන සහ අනෙකුත් වියදම් සඳහා අවශ්‍ය අරමුදල් සමාගම වෙත ලබා දීම සිදු කරන ලදී. මෙම ගනුදෙනු වාර්තා කිරීම සඳහා පාලන ගිණුමක් පවත්වා ගෙන ගිය අතර එහි අවසාන හර ශේෂය රු. | ගොවීන්ගෙන් ලැබිය යුතු මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 10,403,683 කි. අයකර ගැනීම සිදු කිරිම සඳහා පසු විපරම් ක්‍රියා පටිපාටි සිදු කරමින් පවති. | |
| (ඈ) | වසර 10කට අධික කාලයක් පුරා පවතින අනෙකුත් ණයගැතියන්ගෙන් රු. 7,230,203ක මුදලක් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අපනයනකරුවන්ට ලබා දී ඇති මූල්‍ය ආධාරවල ඉතිරි කොටස මෙමඟින් නියෝජනය කෙරේ. දැනට වසා දමා ඇති ණයගැති සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලයේ නීති අංශය කටයුතු කරමින් සිටී. | ණයගැතියන්ගෙන් ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති සහ රෙගුලාසි ආදිය වෙත යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ප්‍රවාහන දීමනාව සඳහා සුදුසුකම් නොලබන MM, PL, MA සහ JM වැටුප් කාණ්ඩ යටතේ මණ්ඩලයේ සේවය කරන සේවකයින් 162 දෙනෙකු සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. 13,975,608 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | MM, JM, MA සහ PL කාණ්ඩවල සේවකයින් සඳහා 2023 වර්ෂය තුළ මණ්ඩලය විසින් එකතුව රු. 13,975,608 ක් වූ ප්‍රවාහන දීමනා ගෙවා ඇත. 2022 දෙසැම්බර් 01 දිනැති අංක 2022/11/532 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් ලබා දුන් අනුමැතියට අනුව පැමිණීම මත මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දෙන ලදී. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කරමින් ප්‍රවාහන දීමනා ගෙවිය යුතුය. |
| (ආ)මුදල් රෙගුලාසි 756 (6) | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඊළඟ වසරේ ජුනි 15 වැනි දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මෙම වාර්තාවේ දිනය වන විටද | භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතින අතර, වාර්තාව 2023 ජූලි 31 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි මගින් නියම කර ඇති පරිදි, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |

විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 77,657,726 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප අතිරික්තය රු. 314,329,241 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 236,671,515 ක පිරිහීමක් නිරීක්ෂණය විය. අනෙකුත් විස්තීරණ ආදායම රු. 101,580,956කින් අඩු වීම, සහ ආයෝජන සහ අනෙකුත් ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදන රු. 139,996,919 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ආර්ථික නොවන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ අයිතිය යටතේ නොමැති ඉඩමක් සහ මණ්ඩලය පිහිටා ඇති ගොඩනැගිල්ලේ මහල්වල බදු කුලිය සම්බන්ධයෙන් තක්සේරු වාර්තා 2 ක් ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් රු. 1,043,150 ක් වැය කර තිබුණි. | DHPL හි කොටස් හිමිකම මුල් තත්ත්වයට වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට DHPL හි කොටස්හි ගැනුම් මිල පිළිබඳ සාකච්ඡා කිරීමට අවශ්‍ය විය. අපනයන සංවර්ධන මණ්ඩලය මගින් රු.2,368,120ක තක්සේරු ගාස්තුවක් ගෙවා ඇති අතර, NDB සහ DHPL අතර කල්බදු ගිවිසුම අලුත් කිරීමට අවශ්‍ය වූ මහල්වල කුලී වටිනාකම තීරණය කිරීම සඳහා එම තක්සේරු වාර්තාවේ තොරතුරු ජාතික සංවර්ධන බැංකුව විසින් ද භාවිතා කරන බැවින්, ජාතික සංවර්ධන බැංකුවෙන් රු.1,324,970ක් ලබා ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලයට හැකි විය. එබැවින්, මේ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දරන ලද තථ්‍ය පිරිවැය රු.1,043,175ක් ලෙස දැක්විය යුතුය. | මණ්ඩලයේ හිමිකාරීත්වය යටතේ නොපවතින වත්කම් මත මණ්ඩලය වියදම් නොදැරිය යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් ආයෝජනය කර ඇති සමාගම්වල පැවැත්ම සම්බන්ධයෙන් සිදු කරන ලද අඛණ්ඩ පසු විපරම් ක්‍රියා පටිපාටි ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සමාගම් ලේඛනයෙන් කපා හරින ලද සමාගම් 26ක කොටස්වල ආයෝජනය කළ රු. 40,217,028 ක ආයෝජනයක් ආපසු අය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් විය. | සමාගම් පනතට ඇතුළත් කිරීමට නියමිත නව ප්‍රතිපාදනවලට අනුව, එම සමාගම්වල ආයෝජනය කර ඇති මුදල රජය මගින් පවරා ගත් වත්කම්වලින් ඉල්ලා සිටීමට මණ්ඩලය කටයුතු කරනු ඇත. බලපෑමට ලක් වූ සමාගම්වල අධ්‍යක්ෂවරුන් පිළිබඳ දත්ත රැස් කරමින්, ඔවුන් සමඟ සාකච්ඡා කරමින්, මෙම තොරතුරු මණ්ඩලයේ වාර්තාවලට ඒකාබද්ධ කිරීමට මණ්ඩලය විසින් තවමත් කටයුතු කරමින් සිටී. | ඵලදායී හා කාර්යක්ෂම ආයෝජන තීරණ ගැනීම සඳහා මණ්ඩලය විසින් ආයෝජනය කර ඇති සමාගම්වල පැවැත්ම සම්බන්ධ පසු විපරම් ක්‍රියා පටිපාටි සිදු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් 30 ක භෞතික ප්‍රගතිය සියයට 10 සිට සියයට 50 දක්වා පරාසයක පැවතුනි. | තානාපති කාර්යාලවලින් සහ අපනයනකරුවන්ගෙන් ප්‍රතිචාර ලැබීම් අඩුවීම, ක්‍රියාත්මක කිරීමේ අධික පිරිවැය පියවා ගැනීමට අයවැය ප්‍රමාණවත් නොවීම, ක්‍රියාත්මක කිරීමට ඇති කාලයේ සීමාවන්, ක්ෂේත්‍ර චාරිකා සඳහා ඇති බාධා ඇතුළු විවිධ හේතු නිසා මෙය සිදු විය. | බලපාන සියලු කරුණු සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) අපනයනකරුවන් 81 දෙනෙකු සහභාගී වූ රු. මිලියන 16.487 ක පිරිවැයක් දැරීමට සිදු වූ අපනයන ප්‍රවර්ධන වැඩසටහන් 07 ක ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් පසු විපරම් ක්‍රියාපටිපාටි මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | වෙනත් පාර්ශ්ව විසින් වැඩසටහන සංවිධානය කිරීම, ප්‍රගති වාර්තා ඉල්ලා සිටිය ද සහභාගිවන්නන් විසින් එම ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකිරීම, අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් වැඩසටහන් සඳහා සහභාගී නොවීම ඇතුළු විවිධ හේතු මේ සඳහා හේතු විය. | අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඇගයීම සඳහා ප්‍රමාණවත් පසු විපරම් ක්‍රියා පටිපාටි සිදු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 14 න් තනතුරු 06 ක් ද, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 64 න් 23 ක් ද, කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 44 න් 14 ක් ද, කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 126 න් තනතුරු 46 ක් ද පුරප්පාඩු වී තිබුණි. | රටේ පවතින තත්ත්වයන් යටතේ, 2023 වර්ෂයේ දී පුරප්පාඩු පිරවීම සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධයෙන් චක්‍රලේඛ මගින් වරින් වර සීමාවන් ගණනාවක් පනවන ලදී. කෙසේ වුවද, 2024 වර්ෂයේ දී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට අපනයන සංවර්ධන මණ්ඩලය කටයුතු කර ඇත. | මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවිය යුතුය. |